// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2089/25 - 2018 සැප්තැම්බර් මස 18 වැනි අඟහරුවාදා - 2018.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සකස් කර විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා සබරගමුව පළාත් සභාව විසින් සම්මත කරන ලද බව *ගැසට් පත්‍රය* මඟින් නිවේදනය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සාදන ලදුව 2013.01.24 දින පැවති එකී ප්‍රාදේශීය සභාවේ මාසික රැස්වීමේදී සම්මත කරනු ලැබූ සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වන වගන්තියේ (11) වන උප වගන්තියෙන් සබරගමුව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.05.16 දිනැති අංක 1863 *ගැසට් පත්‍රයේ* IV (අ) වන කොටසේ නිවේදනය කරනු ලැබූ සහ බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ඒ ස්ථාන වල නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හා මහජන පුස්තකාල විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන උප වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 125 වගන්තිය ප්‍රකාර, සබරගමුව පළාතේ පළාත් සභාව විසින් 2017.09.26 වැනි දින සබරගමුව පළාත් සභාවේදී කියවා සම්මත කරනු ලැබූ බව නිවේදනය කරනු ලැබේ.

ශ්‍රියානි පද්මලතා,<br>
ලේකම්,<br>
නීතිය හා සාමය, මුදල් හා සැලසුම්,<br>
පළාත් පාලන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය,<br>
වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර,<br>
මගී ප්‍රවාහන සහ වතු සුබසාධන,<br>
පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශය.

10 - 62

1A - PG 4235 — 08 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*